UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

විශ්වවිද්‍යාල රෝහල
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## හෙද සහායක
(පැයට ගෙවීමේ පදනම මත)

## 1. හෙද සහායක

**<u>සුදුසුකම්:</u>**

I. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරිමේ අධිකාරිය (NAITA) මගින් පවත්වනු ලබන වෘත්තීය සුදුසුකම් කාණ්ඩ අංක 03 හෝ 04 (NVQ 03 or 04) හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

හෝ

II. තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි (TVC) ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වනු ලබන හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

හෝ

III. ශ්‍රී ලංකා පෞද්ගලික වෛද්‍ය නියාමන සභාව යටතේ ලියාපදිංචි වී ඇති හෙද පුහුණු ආයතනයකින් හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

සහ

IV. අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**<u>විශේෂ සුදුසුකම්:</u>**

සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම සම්මුඛ පරීක්ෂණයේදී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**<u>වැටුප:</u>**

පැයකට රු.250.00 ක් වශයෙන් ගෙවනු ලැබේ.

**<u>පොදු කොන්දේසි</u>**

1. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන වෘත්තිය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපැලෙන් 2021.03.03 දිනට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,වේරහැර" යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම්කවරයේ ඉහල වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

2. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

3. ප්‍රමාදවූ, අසම්පූර්ණ හෝ අදාල ආකෘතියට පටහැනි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. www.kdu.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් පසුව විස්තර ලබාගත හැකිය.

**www.kdu.ac.lk**

Source: https://www.kdu.ac.lk (2021.02.22)